# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 පෙබරවාරි**


**03 වෙළුම 02 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2021 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 952ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.7කින් පහත වැටුණි.

2021 වසරේ පෙබරවාරි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,524ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 2.5කින් පහත වැටුණි.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 5.3කින් පහළ ගිය අතර, ආනයන වියදම සියයට 5.5කින් පහළ ගියේය.


වෙළඳ හිඟය 2020 වසරේ පෙබරවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 574ට සාපේක්ෂව 2021 වසරේ පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 572ක් දක්වා අඩු විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.-පෙබ.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-පෙබ.)




කාර්මික අපනයන පහත වැටීම හේතුවෙන් 2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අපනයන ආදායම පහත වැටුණු අතර, කෘෂිකාර්මික, ඛනිජ සහ වෙනත් අපනයන ඉහළ ගියේය.


### අපනයන පරිමා දර්ශකය - (ජන.-පෙබ.)





2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අපනයන පරිමා දර්ශකය පහත වැටුණු අතර, කාර්මික සහ කෘෂිකාර්මික අපනයන පරිමා පහත වැටීම මේ සඳහා හේතු විය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)




### තේ සහ රබර් මිල ගණන් *





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල් - අගෝස්තු කාලපරිච්ඡේදයේ රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.




2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම ඉහළ ගිය අතර, මේ සඳහා කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු සහ ගම්මිරිස්), තේ සහ පොල් අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ එළවළු අපනයන ආදායම පහත වැටුණි.

## කාර්මික අපනයන


කාර්මික අපනයන ආදායම





කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)





නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී කාර්මික අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ රෙදිපිළි හා ඇඟලුම් අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු විය. කෙසේ වුවද, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය

ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-පෙබ.)





ආනයන පරිමා දර්ශකය (ජන.-පෙබ.)





2021 පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම පහත වැටුණු අතර, මේ සඳහා පාරිභෝගික, ආයෝජන සහ වෙනත් ආනයන පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ආනයන පරිමා දර්ශකය ද පහත වැටුණු අතර, මේ සඳහා අන්තර් භාණ්ඩ හැර අනෙකුත් සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩවල පරිමා පහත වැටීම හේතු විය.

## පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහත වැටුණු අතර, විදුලි සංදේශ මෙවලම් ආනයන ඉහළ ගිය ද පෞද්ගලික රථවාහන සහ රෙදිපිළි හා උපාංග ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගිය අතර, සීනි සහ තෙල් හා මේද ආනයන වියදම ඉහළ යෑම ඒ සඳහා හේතු විය.

## අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



**අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)**





**බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)**





2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගිය අතර, තිරිඟු හා ඉරිඟු, රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ඉන්ධන සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම පහත වැටුණි.

## ආයෝජන භාණ්ඩ ආනයනය


**ආයෝජන භාණ්ඩ ආනයන වියදම**




**ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක**




**ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-පෙබ.)**




2021 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ වැටුණු අතර, මේ සඳහා සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම පහත වැටීම හේතු විය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | පෙබ. - 20 | පෙබ. - 21 | වෙනස (%) | ජන. -පෙබ. 2020 | ජන. -පෙබ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **195.1** | **206.5** | **5.9** | **383.8** | **406.5** | **5.9** |
| එයින් | තේ | 107.8 | 112.5 | 4.4 | 207.5 | 213.5 | 2.9 |
| | පොල් | 26.2 | 30.9 | 18.1 | 50.7 | 55.1 | 8.6 |
| | කුළුබඩු | 18.7 | 33.1 | 77.6 | 38.1 | 75.2 | 97.1 |
| | මුහුදු ආහාර | 20.6 | 14.1 | -31.6 | 44.2 | 31.0 | -30.0 |
| **කාර්මික අපනයන** | | **790.1** | **740.3** | **-6.3** | **1,602.7** | **1,472.6** | **-8.1** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 468.1 | 443.3 | -5.3 | 942.2 | 866.3 | -8.1 |
| | රබර් නිෂ්පාදිත | 71.5 | 81.0 | 13.2 | 141.7 | 161.2 | 13.7 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 57.8 | 22.7 | -60.8 | 140.6 | 57.1 | -59.4 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 36.6 | 41.7 | 13.7 | 72.1 | 81.4 | 12.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 34.8 | 39.6 | 13.9 | 65.3 | 80.7 | 23.7 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 21.4 | 19.7 | -8.2 | 46.1 | 43.1 | -6.7 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 7.3 | 4.5 | -39.2 | 12.9 | 7.9 | -38.4 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.3** | **4.9** | **48.0** | **6.9** | **9.3** | **35.4** |
| **මුළු අපනයන** | | **988.5** | **951.7** | **-3.7** | **1,993.4** | **1,888.4** | **-5.3** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | පෙබ. - 20 | පෙබ. - 21 | වෙනස (%) | ජන. -පෙබ. 2020 | ජන. -පෙබ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **327.3** | **272.7** | **-16.7** | **699.0** | **618.3** | **-11.5** |
| **ආහාර හා පාන වර්ග** | | 135.8 | 131.8 | -3.0 | 283.4 | 315.6 | 11.4 |
| එයින් | එළවළු (අ) | 30.0 | 27.2 | -9.4 | 65.9 | 67.6 | 2.6 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 191.4 | 140.9 | -26.4 | 415.7 | 302.7 | -27.2 |
| එයින් | පෞද්ගලික රථවාහන | 53.6 | 0.9 | -98.3 | 116.9 | 1.4 | -98.8 |
| **අන්තර් භාණ්ඩ** | | **911.5** | **945.9** | **3.8** | **1,846.0** | **1,860.8** | **0.8** |
| එයින් | ඉන්ධන | 418.7 | 320.2 | -23.5 | 710.6 | 630.0 | -11.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 182.0 | 222.8 | 22.4 | 482.8 | 459.2 | -4.9 |
| | පොහොර | 13.2 | 14.0 | 5.7 | 19.2 | 18.7 | -2.6 |
| | තිරිඟු හා ඉරිඟු | 8.4 | 55.5 | 558.6 | 17.3 | 62.4 | 260.1 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **323.6** | **305.0** | **-5.7** | **752.7** | **636.1** | **-15.5** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 183.5 | 193.8 | 5.6 | 442.1 | 410.5 | -7.2 |
| **මුළු ආනයන** | | **1,562.3** | **1,523.6** | **-2.5** | **3,297.7** | **3,115.2** | **-5.5** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | පෙබ. - 20 | පෙබ. - 21 | වෙනස (%) | ජන. -පෙබ. 2020 | ජන. -පෙබ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -573.8 | -571.9 | | -1,304.2 | -1,226.8 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ආ)

| කාණ්ඩය | | පෙබ. - 20 | පෙබ. - 21 | වෙනස (%) | ජන. -පෙබ. 2020 | ජන. -පෙබ. 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 137.6 | 132.5 | -3.7 | 138.7 | 131.4 | -5.3 |
| | පරිමා දර්ශකය | 132.5 | 130.4 | -1.6 | 141.3 | 132.9 | -5.9 |
| | මිල දර්ශකය | 103.8 | 101.6 | -2.2 | 98.2 | 98.9 | 0.7 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 139.8 | 136.4 | -2.5 | 147.6 | 139.4 | -5.5 |
| | පරිමා දර්ශකය | 157.5 | 151.4 | -3.9 | 165.3 | 158.6 | -4.0 |
| | මිල දර්ශකය | 88.8 | 90.1 | 1.4 | 89.3 | 87.9 | -1.6 |
| **වෙළඳ මිල අනුපාතය** | | 116.9 | 112.8 | -3.5 | 110.0 | 112.5 | 2.3 |

(අ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද